බළන්ගොඩ නගර සභාව

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

2027 වර්ෂයට පහත දැක්වෙන සැපයුම් හා සේවාවන් සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට 2026.11.30 දින දක්වා අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ සභාපති වන මා විසින් කැඳවනු ලැබේ. සැපයුම්කරුවෙකු හෝ කොන්ත්‍රාත්කරුවෙකු වශයෙන් ලියාපදිංචි වීමේදී පහත සඳහන් පරිදි ගාස්තු අයකරනු ලබන අතර නියමිත පරිදි ගාස්තු ගෙවමින් එක් අයෙකුට කාණ්ඩ කිහිපයක් යටතේ වුවද ලියාපදිංචි විය හැකිය.

අනු අංකය	කාණ්ඩය	ලියාපදිංචි ගාස්තුව (රු)
01.	කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය	2000.00
02.	වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු	2000.00
03.	පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර ආදිය සැපයීම සහ වායු සමීකරණ යන්ත්‍ර, ආරක්ෂිත කැමරා පද්ධති (CCTV) සවි කිරීම	2000.00
04.	ටෝනර්, කාට්රිජ්, රිබන්, මුද්‍රණ තීන්ත, පරිගණක මෘදුකාංග, පරිගණක උපාංග ආදිය	2000.00
05.	යකඩ බට, අමානෝ තහඩු, සිමෙන්ති, දඟර කම්බි ඇතුළු ගොඩනැගිලි ද්‍රව්‍ය	2000.00
06.	තාර, කෝලාස්ට් ඇතුළු මාර්ග නඩත්තු ද්‍රව්‍ය හා උපකරණ , 6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, ගංගා වැලි ඇතුළු ද්‍රව්‍ය සහ සියළුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන,	2000.00
07.	නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය	2000.00
08.	ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ	2000.00
09.	තීන්ත වර්ග (එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත)	2000.00
10.	විදුලි උපකරණ (වීදි ලාම්පු, බල්බ, වයර්, ඇතුළු සියලු විදුලි අයිතමයන්)	2000.00
11.	ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් වාහන අමතර කොටස්	2000.00
13.	මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම	2000.00
14.	පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර)	2000.00
15.	වාහන සහ බර යන්ත්‍ර සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතු	2000.00
16.	කුලී පදනම මත යන්ත්‍ර උපකරණ, JCB යන්ත්‍ර, ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම.	2000.00
17.	සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය)	2000.00
18.	පිඟන් භාණ්ඩ	2000.00
19.	පුස්තකාල පොත්	2000.00
20.	ගිණි නිවීමේ උපකරණ, ආරක්ෂක උපකරණ, නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම.	2000.00
21.	ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම.	2000.00
22.	පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම.	2000.00
23	ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න)	2000.00

කොන්ත්‍රාත්කරුවන්

24	රුපියල් ලක්ෂ විස්සට (2,000,000.00) ට අඩු කොන්ත්‍රාත් සඳහා	2500.00
25	රුපියල් ලක්ෂ විස්සට (2,000,000.00) ට වැඩි කොන්ත්‍රාත් සඳහා	5000.00

කොන්දේසි

01. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයන් විසින් බලන්ගොඩ නගර සභා නිල වෙබ් අඩවියේ පළකර ඇති ආදර්ශ අයදුම්පත්‍රය හෝ ඒ අයුරින් සකස් කළ අයදුම්පත්‍රයක් මඟින් 2026.11.30 දිනට පෙර ‘‘සභාපති/ලේකම්, නගර සභාව, බලන්ගොඩ’’ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය.

02. ලියාපදිංචි ගාස්තුව 2026.11.30 දිනට පෙර ලැබෙන සේ, ‘‘සභාපති/ලේකම්, නගර සභාව, බලන්ගොඩ’’ නමට චෙක්පතක් එවීමෙන් හෝ නගර සභාව වෙත මුදලින් ගෙවීමෙන් 2027 වර්ෂය සඳහා ලියාපදිංචි විය හැකිය.

03. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහල කෙළවර ‘‘සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2027’’ යනුවෙන් සඳහන් කළ යුතුය.

04. සභාවේ අවශ්‍යතාවය පරිදි ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවන අතර, සේවා අවශ්‍යතාවය මත ඉන් බාහිරවද භාණ්ඩ හා සේවා සපයා ගැනීමේ අයිතිය මෙම සභාව සතුය.

05. මීට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු හා ගාස්තූන් ද අදාළ වේ.

06. වැඩිදුර විස්තර කාර්යාලයීය දුරකතන අංක 045-4930830 විමසීමෙන් හෝ www.balangoda.uc.gov.lk කාර්යාලයීය නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකිය.

2026.10.22 වන දින
බළන්ගොඩ නගර සභාවේ දීය.

එන්.ඩබ්.පී.ටී. ජයසේන
සභාපති
බළන්ගොඩ නගර සභාව.